## ශ්‍රම පදනම මත සෞඛ්‍ය කම්කරු තනතුරට මාස 06 ක කාලසීමාවකට අනුයුක්ත කර ගැනීම.

## මහා නගර සභාව - මීගමුව.

මීගමුව මහා නගර සභාවේ තලාහේන හා බසාර් 02 කොට්ඨාශවල කසල ඉවත් කිරීම, කාණු පිරිසිදු කිරීම හා අනිකුත් සියලුම පිරිසිදු කිරීම් කටයුතු සිදු කිරීම සඳහා සෞඛ්‍ය කම්කරු තනතුරට ශ්‍රම මිලදී ගැනීම යටතේ මාස 06ක කාලසීමාවකට පහත කොන්දේසි යටතේ සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**කොන්දේසි**

- අධ්‍යාපන සුදුසුකම් - 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය.
- කායික සුදුසුකම් - තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- වෙනත්
  - ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
  - අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.
  - විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- වයස
  - අවම සීමාව - අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතුය.
  - උපරිම සීමාව - අවුරුදු 45ට නොවැඩි විය යුතුය
- මීගමුව මහා නගර සභාවට අයිති තලාහේන හා බසාර් 02 කොට්ඨාශවල කසල ඉවත් කිරීම, කාණු පිරිසිදු කිරීම හා අනිකුත් සියලුම පිරිසිදු කිරීම් කටයුතු නියම කරන දින වලදී නියම කරන ඕනෑම පැය 08 ක කාලසීමාව තුල ඔබගේ සේවය ලබාදිය යුතුය.
- වැඩ කරන දිනකට රු 1925.00 දීමනාවක් ගෙවනු ලැබේ.
- වාචික හා ප්‍රායෝගික පරීක්ෂණයකට ලක්කර සුදුසු අය තෝරා ගනු ලැබේ.
- සේවය ලබා ගැනීමට ඔබව තෝරා ගතහොත් ඔබ මීගමුව මහා නගර සභාව සමඟ ගිවිසුමකට ඇතුළත් විය යුතුය.
- ඔබ විසින් සකස් කරන ලද අයදුම්පතක් 2026.01.30 දිනට පෙර ලැබෙන පරිදි **"නාගරික කොමසාරිස්, මහා නගර සභාව, තෙල්වත්ත හන්දිය, කොළඹ පාර, මීගමුව"** යන ලිපිනයට තැපැල් මගින් හෝ සතියේ වැඩ කරන දින වල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා නාගරික කොමසාරිස් කාර්යාලය වෙත ගෙනවිත් භාරදිය හැක.

නාගරික කොමසාරිස්,
මහා නගර සභාව,
මීගමුව.
2026.01.20